මූලික සාරාංශ ලේඛනය

HSBC ක්‍රෙඩිට් කාඩ්පතක් (ක්‍රෙඩිට් කාඩ්පත) අයදුම් කිරීම හා අප කෙරෙහි තැබූ විශ්වාසයට ස්තුතියි. පැහැදිලි හා විනිවිද භාවයෙන් යුතු ක්‍රියාපිළිවෙළක් සහතික කිරීමට, ක්‍රෙඩිට් කාඩ්පත් හා බැඳි මූලික නීතිරීති සහ කොන්දේසි අප විසින් පහතින් දක්වා ඇත. ඒවා කියවා බැලීමට සුළු කාලයක් වැය කරන්නේ නම්, අප එය අගය කරමු.

- ඕනෑම ක්‍රෙඩිට් කාඩ්පතක් වෙනුවෙන් අයදුම්පත් සහ ණයවර සීමා (මුදල් ආපසුගැනීම් ද ඇතුළුව) අනුමත කිරීම, ද හොංකොං ඇන්ඩ් ෂැංග්හායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් ("HSBC") හි පරම අභිමතය අනුව තීරණය කෙරෙන අතර, අයදුම්කරුට හෝ වෙනත් පාර්ශ්වයකට හෝ එය පූර්ව වශයෙන් තීරණය කළ නොහැකි වේ.
- අවශ්‍ය සියලු ලේඛන විධිමත් නම්, ඔබේ අයදුම්පත HSBC වෙත ලැබුණු පසු, ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත සැකසීමට සාමාන්‍යයෙන් ගත වන්නේ, අවම වශයෙන් වැඩ කරන දින **10**කි.
- මෙම අයදුම්පත HSBC විසින් ප්‍රතික්ෂේප කළහොත්, මෙම අයදුම්පත හා ඒ සමග වන සියලු ලේඛන විනාශ කිරීමේ අයිතිය HSBC රඳවා ගනියි.
- ඔබේ අයදුම්පත අනුමත වුවහොත්, ඔබේ අයදුම්පතෙහි සඳහන් ලිපි ගනුදෙනු කෙරෙන ලිපිනය වෙත දූත සේවාවක් මගින් ඔබේ නව ක්‍රෙඩිට් කාඩ්පත එවනු ඇත.
- ඔබේ අයදුම්පත අනුමත වූ මාසයේ සිට මාස 12 එක් එක් චක්‍ර ආරම්භයේ දී වාර්ෂික ගාස්තුව අය කෙරෙනු ඇති අතර, එය ඔබේ කාඩ්පතෙහි වලංගු කාලසීමාව හා සබැඳි නැත. ගාස්තු අනුපාතික පහත පරිදි වේ:

ගාස්තු අයිතමය	Visa Gold	Visa Platinum Cashback	HSBC Live +	Visa Rewards	HSBC Advance	HSBC Premier
සම්බන්ධවීමේ ගාස්තු (මූලික කාඩ්පත)	අත්හිටුවා ඇත	අත්හිටුවා ඇත	අත්හිටුවා ඇත	අත්හිටුවා ඇත	නොමිලේ	නොමිලේ
වාර්ෂික ගාස්තු (මූලික කාඩ්පත)	රු.2,750/-	රු.4,500/-	රු.4,000/-	රු.6,500/-	නොමිලේ	නොමිලේ
සම්බන්ධවීමේ ගාස්තු (අතිරේක කාඩ්පත)	අත්හිටුවා ඇත	අත්හිටුවා ඇත	අත්හිටුවා ඇත	අත්හිටුවා ඇත	නොමිලේ	නොමිලේ
වාර්ෂික ගාස්තු (අතිරේක ගාස්තු)	රු.750/-	රු.2,000/-	රු.1,500/-	රු.2,500/-	නොමිලේ	නොමිලේ
පොලී අනුපාතිකය (මිලදී ගැනීම් සහ මුදල් අත්තිකාරම්)	මසකට 2.33%	මසකට 2.33%	මසකට 2.33%	මසකට 2.33%	මසකට 2.33%	මසකට 2.12%

- අපගේ ක්‍රෙඩිට් කාඩ්පත් සමග උපරිම දින **51**ක සහ අවම දින **21**ක පොලී රහිත ණයවර ඔබ වෙත ලැබෙනු ඇත.
- බිල්ගත කෙරුණු ඔබගේ ගනුදෙනු, ගෙවීමට නියමිතව පවතින හිඟ ශේෂය, ගෙවීමට නියමිත අවම මුදල, ගෙවීමට නියමිත දිනය, HSBC Rewards සාරාංශය සහ HSBC විසින් ඔබට දැන්වීමට කැමති වැදගත් තොරතුරු ආදී සියල්ල අඩංගු මාසික ප්‍රකාශනයක් ඔබ වෙත ලැබෙනු ඇත.
- HSBC සතුව බහුවිධ ප්‍රකාශන චක්‍රයන් පවතින අතර, ඔබේ පහසුව අනුව, ඔබේ ප්‍රකාශන උත්පාදනය කරනු ලබන දිනය ඔබට වෙනස් කළ හැකිය.
- ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත මත ගෙවීමට නියමිත අවම මුදල පහත පරිදි වේ:
    - ➢ ඔබගේ එක් එක් මුදල් වාරික සැලසුම් සහ වැය වාරික සැලසුම් තිබේ නම්, ඒ පිළිබඳ මාසික වාරික මුදල **100%**; ද
    - ➢ ඔබේ ගිණුමට අයකර ඇති යම් පොලියක්, ප්‍රමාද ගාස්තු, සහ සීමාව-ඉක්මවීමේ ගාස්තු; ද
    - ➢ ක්‍රෙඩිට් කාඩ්පත සඳහා වන වාර්ෂික ගාස්තුවෙන් 1/12ක්; ද
    - ➢ ගෙවීමට නියමිතව පවතින ඉතිරි හිඟ ශේෂයෙන් **1%** (එනම්, ඔබේ ගෙවීමට නියමිතව පවතින සමස්ත හිඟ ශේෂයෙන් ඉහත කරුණු තුන යටතේ දක්වා ඇති මුදල් අඩු කිරීමෙන් පසු); ද
    - ➢ ඔබේ ගිණුම සීමාව-ඉක්මවා ඇතිනම්, ඔබේ ණයවර සීමාවට ඉහළ අතිරික්ත මුදල, හෝ රු.500/- යන අගයයන් දෙක අතරින් ඉහළ අගය. කෙසේ වෙතත්, ඔබ විසින් ගෙවීමට නියමිතව පවතින සමස්ත ශේෂය රු.500/-ට වඩා අඩු නම්, ඔබ විසින් ගෙවිය යුතු අවම මුදල වන්නේ, ඔබේ ගෙවීමට නියමිතව පවතින සමස්ත ශේෂයයි.
- ඔබේ ගෙවීමට නියමිත දිනය නිවාඩු දිනයක් වුවහොත්, ගෙවීමට නියමිත දිනය වන්නේ, බැංකු වැඩකරන ඊළඟ දිනයයි
- ගෙවීමට නියමිත දිනට සම්පූර්ණ ගෙවීම සිදු නොකළහොත් හෝ ගෙවීමට නියමිත දිනට පෙර, එදින හෝ එදිනට පසුව හෝ අර්ධ හෝ අවම ගෙවීම සිදු කළහොත් හෝ ගෙවීමට නියමිත දිනට පසුව සම්පූර්ණ ගෙවීම සිදුකළහොත් හෝ පොලිය අය කෙරෙනු ඇත. අය විය යුතු පොලිය, ඉන් අනතුරුව වන ප්‍රකාශන චක්‍ර දින දී කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත
- බිල්ගත කිරීමේ කාලසීමාව තුළ යම් අවස්ථාවක, දී ඇති ණයවර සීමාව ඉක්මවා තිබේ නම්, රු.2,100/-ක සීමාව-ඉක්මවීමේ ගාස්තුවක් අය කෙරෙනු ඇත. ඉහත කරුණ සම්බන්ධයෙන්, ණයවර සීමාව ඉක්මවා තිබේදැයි ගණනය කිරීමේ දී, HSBC හි අය කිරීම්/ගාස්තු ආදිය ද සැලකිල්ලට ගනු ඇත

- ගෙවීමට නියමිත දිනය වනවිට ගෙවීමට නියමිත අවම ගෙවීමේ ප්‍රමාදයක් වේ නම්, රු.2,100/-ක ප්‍රමාද ගාස්තුවක් අය කෙරෙනු ඇත
- මුදල් අත්තිවාරම් ගාස්තුව වශයෙන් රු.990/-ක් හෝ ආපසුගැනීමේ මුදලෙහි වටිනාකමින් 5%ක් යන දෙක අතරින් ඉහළ අගය, එක් එක් මුදල් ආපසුගැනීමක දී අය කෙරෙනු ඇත. සියලු අයකිරීම් සහ ගාස්තු (ඉහත දෑ ද ඇතුළත්ව) HSBC පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk හි දක්වා ඇති ආකාරයට බවත්, කාඩ්පත් හිමියන් වෙත පූර්ව දැනුම්දීමක් සහිතව HSBC හි අභිමතය පරිදි වෙනස්වීමට විෂය වන බවත් කරුණාවෙන් සලකන්න
- නීතියෙන් අවශ්‍ය කෙරෙන පරිදි, ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශය සහ/හෝ වෙනත් නියාමන ආයතන සමග අප විසින් ඔබේ ණයවර දත්ත බෙදා-හදා ගනු ඇත
- ඔබේ නව ක්‍රෙඩිට් කාඩ්පත සමග ඔබ වෙත ලබාදෙනු ලබන කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම මගින් සියලු කාඩ්පත් හිමියන් බැඳී සිටිනු ඇත
- මෙම ලේඛනය ඔබගේ පහසුව සඳහා පමණක් බවත්, මෙමගින් කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම ප්‍රතිස්ථාපනය වීමක් සහ/හෝ ඉක්මවා යාමක් සිදු නොවන බවත් කරුණාවෙන් සලකන්න මෙහි දක්වා ඇති සහ කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමෙහි දක්වා ඇති නීතිරීති සහ කොන්දේසි අතර යම් නොගැළපීමක් ඇති වුවහොත්, එවිට කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමෙහි දක්වා ඇති නීතිරීති සහ කොන්දේසි බලපැවැත්වෙනු ඇත. මෙහි දක්වා ඇති ස හා HSBC ගාස්තු අයක්‍රම පොත්පිංචෙහි දක්වා ඇති ගාස්තු අතර යම් නොගැළපීමක් ඇති වුවහොත්, HSBC ගාස්තු අයක්‍රම පොත්පිංචෙහි දක්වා ඇති ගාස්තු බලපැවැත්වෙනු ඇත
- ඔබ විසින් කඩදාසි ප්‍රකාශන සඳහා විශේෂිතවම ඉල්ලුම් කර ඇත්නම් මිස, ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා වන අයදුම් පතෙහි සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය හරහා විද්‍යුත් තැපෑල මගින් ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශනය ඔබ වෙත එවනු ඇති බව කරුණාවෙන් සලකන්න. කඩදාසි ප්‍රකාශන සඳහා රු.200ක මාසික ගාස්තුවක් අය කෙරෙයි
- ඔබේ පහසුව සඳහා, ක්‍රෙඩිට් කාඩ්පත මත ගෙවීමට නියමිත හිඟ මුදල, ලබාගත හැකි ණයවර සීමාව, අවම ගෙවීමේ මුදල සහ ගෙවීම නියමිත දිනය තහවුරු කරගැනීම සඳහා වන 'HSBC CC' සේවාවට ඔබ ලියාපදිංචි වී ඇත. මෙම සේවාව භාවිතය සඳහා ඔබ විසින් කළ යුතු දෙය වන්නේ "4722" මගින් "HSBC CC" වෙත කෙටි පණිවුඩයක් (SMS) එවීමයි
- ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත පිළිබඳ වැඩි විස්තර සඳහා අපගේ නීතිරීති සහ කොන්දේසි බලන්න නැතහොත්, පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk වෙත පිවිසෙන්න
- HSBC සඳහා සහ ඒ වෙනුවෙන් නීල්සන් කම්පනි ලංකා ලිමිටඩ් (පුද්.) සමාගම ("සමාගම") විසින් මේ වනවිට පාරිභෝගික අත්දැකීම් පිළිබඳ සමීක්ෂණයක් ("සමීක්ෂණය") සිදු කරමින් පවතින

බවත්, HSBC හි පාරිභෝගික සේවාවෙහි මට්ටම් පිළිබඳ මාගේ ප්‍රතිචාර ලබාගැනීමට සමාගමේ නියෝජිතයන් දුරකථනය මගින් මා හා සම්බන්ධ වනු ඇති බවත් මම අවබෝධ කරගෙන සිටිමි.

- **HSBC විසින් ඉහත කී නීතිරීති සහ කොන්දේසි ප්‍රමාණවත් අන්දමින් මා හට පැහැදිලි කර දුන් බවත්, ඒවා මා විසින් මනාව තේරුම් ගත් බවත් මම තහවුරු කරමි.**

CPD/INS/CBC/JAN/2025 (S)